**සැකසුම: කථිකාචාර්ය නුවන් සමීර**

## රාජ්‍ය නොවන සංවිධාන (Non Government Organizations)

195 වන වගන්තියට අනුව ''රාජ්‍ය නොවන සංවිධානයක්'' යනුවෙන් රාජ්‍ය නොවන ව්‍යාවසායෙන් යුතු, ස්වේච්ඡා පදනමක් මත එක් තැනැත්තෙක් හෝ තැනැත්තන් කණ්ඩායමක් විසින් පිහිටවනු ලැබේ.

(a) දුප්පත් හා අසරණ අයට රෝගී තැනැත්තන්ට, අනාථ දරුවන්ට, වැන්දඹුවන්ට, යෞවනයන්ට සහ ළමයින්ට සහන සැලසීම සඳහා හෝ

(b) ආදායම් බදු කොමසාරිස් විසින් රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස පිළිගනු ලබන සාමාන්‍යයෙන් අවශ්‍යතා ඇති අයට සහන සැලසීම සඳහා ස්ථාපිත කරනු ලබුවා වූ සහ පිහිටවනු ලැබුවා වූ සංවිධානයක් හෝ සංගමයක්.

(c) පුණ්‍යායතන ඇතුලත් නොවේ.

- 68 වන වගන්තියට අනුව රාජ්‍ය නොවන සංවිධානයක් විසින්, යම් තක්සේරු වර්ෂයක් තුලදී ප්‍රදාන පරිත්‍යාග දායක මුදල් හෝ වෙනත් යම් ආකාරයකින් ලැබුණු එවැනි මුදල්වලින් 3% ක් පමණක් 30% බදු අනුපාතයට යටත් වේ.
- ආයෝජන වත්කම් උපලබ්ධි කිරීම මත ලැබෙන ලාභය 10% බදු අනුපාතයට යටත් වේ.
- ඉහත දෑ වලට අමතරව රාජ්‍ය නොවන සංවිධානයක බදු අය කළ හැකි ආදායම මත 30% ක අනුප්‍රමාණයකින් බදු ගෙවිය යුතුය.

### ප්‍රශ්නය

XYZ රාජ්‍ය නොවන සංවිධානයට 2025/26 තක්සේරු වර්ෂයේදී පහත ආදායම් ලැබී තිබේ.

- විදේශ පරිත්‍යාග රු.3,000,000
- ස්ථාවර තැන්පතු මත පොලී රු. 350,000
- ප්‍රාග්ධන ලාභ රු. 400,000

2025/26 තක්සේරු වර්ෂය සඳහා XYZ හි බදු වගකීම ගණනය කරන්න.

## පුණ්‍යනායතන (Charitable Institution)

195 වන වගන්තියට ආයතනය යන්නෙන්,
පුණ්‍යය කාර්යයක් සඳහා පමණක් පිහිටවනු ලැබූ හෝ හුදෙක් පුණ්‍ය කාර්යයක් කරගෙන යාමෙහිලා යෙදී සිටින යම් භාරයක, භාරකරුවෙකු හෝ භාරකරුවන් හෝ සංස්ථාවක් හෝ සංස්ථාගත නොකරන ලද පුද්ගල මණ්ඩලයක් අදහස් වේ.

- ආයෝජන වත්කම් උපලබ්ධි කිරීමෙන් ලැබෙන ලැබීම් මත 10% අනුපාතය මත ද,
- ඉතිරි බදු අය කළ හැකි ආදායම මත 14% අනුප්‍රමාණයකින් බදු ගෙවිය යුතුය.

**සැකසුම: කථිකාචාර්ය නුවන් සමීර**

**විශේෂ**

2020.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආගමික කටයුතු පිළිබඳ විෂයභාර අමාත්‍යාංශය සමඟ ලියාපදිංචි වී ඇති ඕනෑම ආගමික ආයතනයක් ලබන **ප්‍රදාන හෝ පරිත්‍යාග** ආදායම් බද්දෙන් සම්පූර්ණයෙන්ම නිදහස් කෙරේ.

**ප්‍රශ්නය**

2025/26 තක්සේරු වර්ෂයේ ABC පුණ්‍යායතනයට පහත අදායම් ලැබී තිබේ.

| | |
|---|---|
| කුලී ආදායම | - රු. 240,000 |
| ව්‍යාපාර ආදායම | - රු. 125,000 |
| ප්‍රාග්ධන ලාභ | - රු. 200,000 |
| පරිත්‍යාග | - රු. 300,000 |

**අවශ්‍ය දේ:**

2025/26 තක්සේරු වර්ෂය සඳහා මෙම පුන්‍යායතනයේ බදු වගකීම ගණනය කරන්න.

JMC vLearning
"your virtual learning partner"